දිවයින

වටමඬල

සාහිත්‍යකලාවසංස්කෘතිය

2024 සැප්තැම්බර් මස 19 වැනිදා බ්‍රහස්පතින්දා

# ලිවිසැරියෙන් මැවූ ස්ත්‍රීත්වය

ස්වභාව ධර්මයේ අපූර්ව වූ නිර්මාණය කාන්තාවයි. ලෝකයේ පැවැත්ම රඳා පවතින්නේ ඇය නිසාය. දියණියක්, තරුණියක්, මවක් ලෙස භූමිකාවන් රඟ දක්වන ඇය විඳින බාධක කම්කටොලු පිළිබඳව අමුතුවෙන් කිව යුතු නැත. දෙවියන් මිනිසා මැවූ බවත් මිනිසාගේ තනිකමට කාන්තාව මැවූ බවත් පුරාතනයේ සඳහන්ය. ඒ අනුව ඕනෑම කවියකුගේ, ලේඛකයකුගේ, සිත්තරෙකුගේ සුන්දරම වස්තුව වී ඇත්තේ ස්ත්‍රියයි.

පුරාතන සාහිත්‍යය විමසා බලන කල කාන්තාව යම් යම් දේට උපමා කරමින් සාහිත්‍ය නිර්මාණ රචනා වී ඇති බව පෙනෙයි. රණ තිසර පියයුරු, අඩසඳවන් නළල, නා දලුමෙන් තොල් කාන්තාවන්ගේ එකී වර්ණනයට පාත්‍ර වී ඇත. රජවරුන් පවා කාන්තාවගේ රූපශ්‍රීයට වශී වූ බවත් ඔවුන්ගෙන් අසීමිත සතුටක් ලබාගත් බවත් රාහුල හිමියන්, වැත්තෑවේ හිමියන්, අමාවතුරේ ගුරුළුගොමීන් පවා වර්ණනයට ලක් කර ඇත.

සාහිත්‍යයට ඇත්තේ දිගු ඉතිහාසයකි. දැනට විද්‍යාමාන වන දෘශ්‍ය මූලාශ්‍ර අතර සීගිරි ගී අපට හමුවන්නේ එකල කාන්තාවන් යොදා ගනිමින් ගෙන ගිය වෛශ්‍යා වෘත්තිය සමාජ ගත වී තිබූ ආකාරය පසක් කර දීමටයි. මෙම කාන්තාවන් අබිසරුලියන් ලෙස නම් කළ සාහිත්‍යකරුවා ඔවුන්ගේ හැසිරීම් පවා අප්‍රසන්න වූ බව එකී කවි මගින් ගම්‍ය කරයි. තම ස්වාමියාගේ සම්පත් හිඟ වනවිට අන් පිරිමින් සමග සුහදකම් පවත්වන්නට ගිය සීගිරි ළඳුන්ට චෝදනා කළේ එකල සමාජ තත්ත්වය පෙරදැරි කර ගෙනයි.

බුදු සිරිත පදනම් කොටගෙන සාහිත්‍ය නිර්මාණ ආරම්භ වීමද එතැන් පටන් සිදුවිය. දොළොස්මහා කවීන්ගේ ආගමනයත් ඒ අතර කාන්තා නියෝජනයන් ද සිටි බව දැක්විය හැකිය.

සිංහල සාහිත්‍යයේ ගමන් මඟ යුගාන්තික වශයෙන් ගත් කළ දඹදෙණි යුගයේදී ස්ත්‍රිය පිළිබඳ දක්වන්නේ මෙසේය. දෙවැනි පරාක්‍රමබාහු රජුගේ කව්සිළුමිණ ගැහැනියගේ වේදනාව පිළිබඳ විවරණය කරයි. පූජාවලියේ එන යශෝධරාවන්ගේ කතා වස්තුවෙන් පතිවත රැකි කාන්තාවක් පිළිබඳ දෘෂ්ටියක් මවයි. එකී කෘතියේ එන ප්‍රජාපතී දෙවියගේ කතාවේදී තමන්ගේ දරුවා නොවී සුළු මව වුවත් සිදු කරන මෙහෙය සාහිත්‍යකරුවා දක්වන්නේ මාතෘත්වය පෙරදැරි කොටගෙනය. සද්ධර්මරත්නාවලියේ එන උත්තරාවන්ගේ කතාවෙහි එම යුගයේ කාන්තාවන් අනාදිමත් කාලයක සිට නගර ශෝභනියක ලෙස කටයුතු කළ බවත් සඳහන් කරයි. එම කෘතියේ එන පටාචාරා කතා වස්තුවේදී ඇය කාලකණ්ණි ගැහැනියක් ලෙස නිරූපණය වන්නේ කතාවේ ඇති ස්වාමියා දරුවන් මිය යෑම, දෙමාපියන් මිය යෑම ආදී අවස්ථාවන්වලට අනුවය. අවසානයේ ඇයට විනය ධර භික්ෂුණීන් අතර අග්‍රස්ථානය ලැබීමත් කතුවරයා දක්වන්නේ කාන්තාවන්ට ආදර්ශයක් ලබාදෙමිනි.

කුරුණෑගල යුගයේදී ජාතක කතාව හරහා ගෙ ාඩනැගෙන සාහිත්‍ය මගින් කාන්තාව හරහා එකී සමාජ තත්ත්වය නිරූපණය කරයි. ගැහැනිය කටුකයි, චපලයි, අවිශ්වාසයි, බොළඳයි යන්න සාහිත්‍යකරුවා දක්වා ඇත. එකල ආගමික සාහිත්‍යයක් පැවැති නිසා ස්ත්‍රියට ලැබුණේ අවම ස්ථානයකි. ඇයට නිර්මාණකරණය හා අධ්‍යාපනයට අවස්ථාව නොලැබුණි. ජාතක පොතේ එන කතා 65ක්ම පාහේ කාන්තාවගේ නුගුණ වර්ණනා කර ඇත. අන්ධභූත ජාතකය තුළ පුරුෂයාට සසරින් එතෙර වීමට නොහැකි විශාල බැම්ම කාන්තාව බවත් ආසමන්ත්‍ර ජාතකයේදී ස්ත්‍රීන් අසත්පුරුෂයන් බවත් වයසට ගිය කල්හි පවා රාග සිත් ඇති කරගන්නා බව සඳහන් කරයි. කුස ජාතකයේදී පවා පබාවතියගේ රූප සොබාව නිසා රජවරු අතර යුද්ධයක් පවා හටගත් බව ඉතිහාසයේ සඳහන්ය. එහෙත් සම්බුලා ජාතකයේ දී තම ස්වාමියා වෙනුවෙන් යුතුකම් ඉටු කරන භාර්යාවක්, පතිවත රැකි තැනැත්තියක් බව ගම්‍ය වේ. ඇයගේ මනෝභාවයන්, සිල්වත් බිරිඳක් වීම හා බුදු දහමට ලැදි බව ඇයගේ චරිතය තුළින් ගෙන ඒමට සාහිත්‍යකරුවා උත්සාහ දරයි.

දඹදෙණි යුගයෙන් පසු සාහිත්‍ය කලාවේ සුවිශේෂී යුගයක් වන්නේ කෝට්ටේ යුග යයි. කෝට්ටේ යුගය කියූ පමණින් අප කාටත් සිහිවන්නේ සංදේශ කාව්‍යයයි. සංදේශ සාහිත්‍ය තුළ ඇති කාන්තාවන් මනා රූ සපුවක් ඇත්තන්ය. ඒ යුගයේ සශ්‍රීකත්වය පෙන්වීමට එය කදිම නිදසුනකි. දුක් විඳින කාන්තාවන් සංදේශ තුළ අපට හමුවන්නේ නැත. රති කෙළියේ යෙදෙමින් ඉතා සතුටින් කාලය ගත කරන කාන්තාවන් අපට රාහුල හිමිගේ සැළලිහිණි සංදේශයෙන් ද හමුවේ.

වෙසඟන කුගු තන යුග රොන් කොකුමගර
විස එන මඳ පවන් හද විල් ලිහිණි සර
ගොස අලුයම් පස තුරා සවනනෙහි කැර
ආස නිදිගාට හැර නාග සිටු උදා හිර

හංස, පරෙවි, ගිරා, කෝකිල සංදේශවලින් පවා කාන්තාවගේ සුන්දරත්වය මැවූ බව හා පාඨකයාගේ රස නහර පිනා ගිය බව සඳහන් වේ. පැරකුම්බා සිරිත තුළ කාන්තාවන් ප්‍රේමයෙන් මුසපත් වී රජවරුන්ට ආදරය දැක්වූ බව ගම්‍ය වේ. රාහුල හිමියන් කාව්‍යශේඛරය රචනා කරන්නේ උලකුඩය දේවියට පුතෙක් ලබාගැනීමටයි. ''අම්මා'' කියන උතුම් නාමයට අර්ථයක් ලබාදෙමින් අනවශ්‍ය සබඳතාවලට යොමු වීමෙන් ස්ත්‍රීන්හට සිදුවන දේවල් පිළිබඳව ද රාහුල හිමියන් මෙහිදී සඳහන් කරන්නේ කාන්තා සමාජයට ආදර්ශයක් සපයමිනි. ගුත්තිල කාව්‍යයේද කාන්තාව පිළිබඳ වර්ණනයට පාත්‍රවන අතර විටක කාන්තාව උපහාසයට ද ලක් කරයි.

සිංහල සාහිත්‍යය ගමන් මඟෙහි ස්ත්‍රියට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. සෑම සාහිත්‍යකරුවකුම ස්ත්‍රියකගේ සුන්දරත්වය, චපල බව, කාමුකත්වය ශෘංගාරයෙන් මවා තම නිර්මාණවලට පාදක කර ගනී. එහෙත් ඇතැම් සාහිත්‍යකරුවෝ ස්ත්‍රීන්ගේ දුර්ගුණ විවරණය කරති. එහෙයින් අතීතයෙත් වර්තමානයෙත් අනාගතයෙත් සාහිත්‍යධරයන් කාන්තාව වස්තු විෂය කරගෙන නිර්මාණ කරති. අතීතයේදී බුදු දහමින් පෝෂණය ලැබූ සංස්කෘතියක් උරුම සිංහලයෝ ඒ අනුව තම ජීවිතය හැඩ ගස්වා ගත්හ. නමුත් ලෞකික සුබවිහරණයේදී, වාණිජමය සමාජ ක්‍රමයක් බිහි වීමේ ප්‍රතිඵලයක් ලෙස වෘත්තමය වශයෙන් වෛශ්‍ය වෘත්තියට මෙරට කාන්තාව යොමු වූ බව ඉහත සාහිත්‍ය කෘති අධ්‍යයනයෙන් විද්‍යමාන වේ. එකල සාහිත්‍ය කෘති මගින් සාහිත්‍යකරුවාගේ අපේක්ෂාව වී ඇත්තේ කාන්තාව හරහා වර්තමාන සමාජය නිරූපණය කිරීමයි. එහෙයින් සමකාලීන සමාජයේ කාන්තාවන්ට ආදර්ශයක් ලබාගැනීමට පුරාතන සාහිත්‍යය උපකාරී වූ බව මෙයින් විද්‍යමාන වේ.

**කේ.ඒ සුපුනි ප්‍රාර්ථනා කොඩිකාර**

ජන සන්නිවේදන අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය.